මේ වනවිට සමාජ මාධ්‍ය සහ වට්ස්ඇප් වැනි මැසෙන්ජර් සේවාවන් ඔස්සේ විවිධ සාවද්‍ය, සිතාමතා විකෘති කළ නොමඟ යවන සුළු තොරතුරු පැතිරයෑමද වසංගතයකටත් වඩා බරපතළ වී තිබේ. උදාහරණ ලෙසින් දක්වන්නේ නම් කොවිඩ්-19 වසංගතය සම්බන්ධයෙන්ද එවැනිම වූ නොමඟ යවන සුළු කරුණු සංසරණය වේ.
එසේම ගැටළුව වන්නේ ඇතැම් විටක ජනමාධ්‍ය මගින්ද මෙසේ පැතිර යන සාවද්‍ය, විකෘති කළ, නොමඟ යවන සුළු කරුණු නිසි පිරික්සා බැලීමකින් තොරව සමාජගත කිරීමයි.
මෙයට උදාහරණයක් ලෙසින් "ඉන්දියානුවන් පිරිසක් වසංගතය හේතුවෙන් පිළිම වලින් පිළිසරණ යැදීමෙන් පළක් නොවේ යැයි ඒත්තු ගෙන දේව පිළිම පාරට ඇද දැමීමක්" පිළිබඳ පුවතක් දැක්විය හැක. මෙය සමාජ මාධ්‍ය තුළද සංසරණය වූවකි. එසේම මව්බිම කතුවැකියද (05/18) එය සඳහන් කරයි. ඒ ඔස්සේ සිදුවන්නේ එය නිවැරදි තොරතුරක් ලෙසින් සමාජගත වීමයි.
කෙසේ නමුත් මේ පිළිබඳව කරුණු සොයාබැලීමක් පළ කරන පොයින්ටර් පවසන්නේ, මෙම පුවතට අදාළ වීඩියෝ ක්ලිපය 2015 වසර තෙක් පමණ පැරණි, ආගමික චාරිත්‍රයක කොටසක් බවයි!
මාධ්‍යවේදියෙකු විසින් මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් කරන කරුණක් විශ්වසනීය මූලාශ්‍ර, බහු-මූලාශ්‍ර ඔස්සේ තහවුරු කොටගෙන ඉදිරිපත් කළ යුතු බව අපි නැවත නැවතත් සිහිකැඳවන කරුණකි. කෙතරම් සමාජ මාධ්‍ය තුළ සංසරණය වන තොරතුරක් වුවත්, නිසි සොයාබැලීමකින් තොරව පළ කිරීම වගකීම් සහගත මාධ්‍යකරණය නොවේ. එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක්ද වේ.
මූලාශ්‍ර:
https://www.poynter.org/...
https://thelogicalindian.com/.../hindu-ritual-immersion...
#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #pointer